ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT
ඉඩම් මහලේකම් කාර්යාලය,
නො: 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
No: 1200/6, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය / எனது இல / MY NO: 3/7/බිම්සවිය/චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல / YOUR NO:

දිනය / திகதி / DATE: 2014. 07-31

චක්‍රලේඛ අංක:- 2014/05

බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක වන කොට්ඨාශවල
සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සහ අන්තර් පළාත් නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස්වරුන්.

<u>බිම්සවිය වැඩසටහන යටතේ 2014 වර්ෂය සඳහා දිරි දීමනා ගෙවීම</u>

ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ 2014.06.02 දිනැති අංක EST-8/ALLOW/04/0051-1 දරණ ලිපිය මඟින් 2014 වර්ෂය සඳහා දිරි දීමනා ගෙවීම සඳහා අනුමැතිය ලබා දී ඇති බව ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 5/1/3/60 හා 2014.06.16 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇත. මේ අනුව අනුමත කර ඇති දිරි දීමනා ක්‍රමය අනුව බිම්සවිය වැඩසටහන යටතේ ඉටු කරනු ලබන රජයේ ඉඩම් වලට අදාළ රාජකාරි කටයුතු සඳහා දිරිදීමනා ගෙවීම පිණිස අවශ්‍ය උපදෙස් මෙයින් නිකුත් කරන බව සළකන්න.

1. කාර්යසාධන ඉලක්ක

1.1 2014 වර්ෂයේදී බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අදාළව ක්‍රියාත්මක වෙමින් වර්ෂය තුළදී දිරි දීමනා රහිතව ඉඩම් කැබලි 24,000 ක්ද දිරිදීමනා සහිතව ඉඩම් කැබලි 12,000 ක් වශයෙන් ඉඩම් කැබලි 36,000 ක කටයුතු අවසන් කිරීමේ ඉලක්කයක් මෙම දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණ කළ යුතු වේ. එම වාර්ෂික ඉලක්කය සම්පූර්ණ කළහොත් පමණක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල කාර්ය සාධනය පදනම් කරගෙන එම කාර්යන්ට සම්බන්ධ නිළධාරීන්ට දිරි දීමනා ගෙවනු ලැබේ.

1.2 එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් සඳහා දිරි දීමනා සඳහා සුදුසුකම් ලබන කාර්යසාධන ඉලක්ක පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| දිරිදීමනා රහිතව වර්ෂයකට ඉඩම් කැබලි | - | 480 |
| දිරි දීමනා සහිතව වර්ෂයකට ඉඩම් කැබලි | - | <u>240</u> |
| මුළු ඉලක්කය | - | <u>720</u> |

ඉටු කරනු ලබන කැබලි සංඛ්‍යාව යන්නට

- ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීම
- රජයේ ඉඩම් ආඥා පනත යටතේ දිර්ඝකාලීන බදු අනුමැතිය සඳහා ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම
- ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත හා ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ ප්‍රදානපත්‍ර නිකුත් කිරීම

අදාළ කරගත යුතුයි.

කාර්යාලය / பொது / General: 0112-797400
ෆැක්ස් / பெக்ஸ் / Fax: 0112-864051
ඊමේල් / ஈ-மெயில் / E-mail: info@landcom.gov.lk

නිකුත් කරන ලද යම් බලපත්‍රයක්, දීමනාපත්‍රයක් හෝ දීර්ඝකාලීන බදු අනුමැතියක් පසුව යම් හේතුවක් නිසා අවලංගු කිරීමට සිදු වුවහොත් සහ අදාළ කාර්යය වෙනුවෙන් දිරි දීමනා ගෙවා තිබේ නම්, එම ඉඩමට නැවත එවැනි ලියවිල්ලක් නිකුත් කිරීමේදී දිරිදීමනාව ගෙවීම සඳහා ගණනය නොකළ යුතු බව සළකන්න. රජයේ ඉඩම් ආඥා පනත යටතේ නිකුත් කරනු ලබන වාර්ෂික බලපත්‍ර දිරි දීමනා ගෙවීම සඳහා ගණනයේදී අදාළ කර නොගත යුතු බවද සළකන්න.

2. දිරි දීමනාව ගණනය කිරීම

රජයේ ඉඩම් සඳහා දිරි දීමනාව ගණනය කිරීමේදී යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් සඳහා දිරිදීමනාව ලැබීමට සුදුසුකම් ලබන ඉලක්කය සම්පූර්ණ කර ඇත්නම්, පහත සඳහන් පරිදි එක් ඉඩම් කැබැල්ලක් සඳහා දිරි දීමනාව ගණනය කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| * | බලපත්‍රයක් සඳහා | - | රු. 640.00 |
| * | දීමනාපත්‍රයක් සඳහා | - | රු. 460.00 |
| * | දීර්ඝකාලීන බදු අනුමැතිය ලබා ගැනීම සඳහා | - | රු. 460.00 |
| | (ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම දක්වා) | | |

මේ අනුව දිරි දීමනාව රහිතව නියමිත කාලය තුළ ඉටු කළ යුතු ඉලක්කයට අතිරේකව කටයුතු කර ඇති බිම් කැබලි ප්‍රමාණය සඳහා ඉහත පරිදි දිරි දීමනා හිමිවේ.

මෙහි ඇමුණුම් I පරිදි එම දිරි දීමනාව අදාළ කටයුතු ඉටු කිරීමට දායක වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ, පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයේ, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ අන්තර් පළාත් නියෝජ්‍ය/ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලයේ, ප්‍රධාන කාර්යාලයේ සහ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ අදාළ වන නිළධාරීන් සඳහා බෙදී යා යුතුයි.

මෙහිදී ඇමුණුම් I හි සඳහන් යම් කාර්යය කොටසක් සඳහා එක් නිළධාරියෙකුට වඩා වැඩි ගණනක් දායක වන අවස්ථාවලදී එම කාර්ය කොටසට අදාළ දිරි දීමනාවේ කොටස එම නිළධාරීන් අතර බෙදී යා යුතුයි. එසේ බෙදා දෙන ආකාරය සම්බන්ධයෙන් එම නිළධාරීන් සේවය කරන ආයතනයේ ප්‍රධානියාහට තීරණය කළ හැකියි. සමහර අවස්ථාවලදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඇමුණුම් I හි සඳහන් යම් කාර්ය කොටසක් සඳහා වෙනත් කාර්ය කොටසක් ඉටු කරනු ලබන නිළධාරීන් යෙදවීම තුළින් වැඩ කඩිනම් කිරීමට සිදු වන අවස්ථා තිබිය හැක. එවැනි අවස්ථාවලදී එසේ එම කාර්ය කොටස සඳහා සේවයට යොදවා ගන්නා ලද අනෙකුත් නිළධාරීන්ටද ඊට අදාළ දිරිදීමනා කොටස බෙදා හැරිය හැකිය. මේ සඳහා මාගේ අනුමැතිය ලබාගත යුතුයි.

දිරිදීමනාව ගණනය කිරීම සඳහා කාර්ය සාධනය පිළිබඳ ප්‍රගති වාර්තා පදනම් කර ගත යුතු හෙයින්, බිම්සවිය වැඩසටහන යටතේ ඉටු කෙරෙන කාර්යයන් සම්බන්ධයෙන් ඔබ කාර්යාල වල වාර්තා අඛණ්ඩව දින වකවානු සහ ඉටු කරන ලද නිළධාරීන්ගේ විස්තර සහිතව පවත්වා ගත යුතුයි. මාසික ප්‍රගති වාර්තාවක් මා වෙතද එවිය යුතු බව සලකන්න. මෙම වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රගතියද දිරිදීමනා ගෙවීමේදී සැලකිල්ලට ගන්නා බවද කාරුණිකව සලකන්න.

බිම්සවිය වැඩසටහන යටතේ දිරිදීමනාවකට හිමිකම් ලබන නිළධාරීන් එම කටයුතු වෙනුවෙන් අතිකාල දීමනා, නිවාඩු දින වැටුප් ආදී කිසිදු දීමනාවකට හිමිකම් නොලබන බවද කාරුණිකව සලකන්න. එවැනි දීමනා ලබා ගෙන තිබුණහොත් දිරිදීමනා නොගෙවීමට සිදු වන බවද සැලකිය යුතුයි. එහෙත් ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලබා ගැනීමට බාධාවක් නොමැත. අතිකාල දීමනා, නිවාඩු දින වැටුප් ආදිය අනුමත කිරීමේදී මේ පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් වන ලෙස කාරුණිකව දන්වමි. පසුගිය වර්ෂයට අදාළව දැනටමත් දිරි දීමනාවට අමතරව එම වැඩ කටයුතු සඳහාම අතිකාල දීමනා හෝ නිවාඩු දින වැටුප් යම් නිළධාරියෙකුට ගෙවා ඇත්නම්, එම අතිකාල දීමනා හෝ නිවාඩු දින වැටුප් ආපසු අයකර ගැනීමට පියවර ගත යුතුයි.

මෙම දිරිදීමනා ගෙවනු ලබන ආකාරය සම්බන්ධයෙන් හා මෙම චක්‍රලේඛයේ අඩංගු අනෙකුත් උපදෙස් සම්බන්ධව බිම්සවිය වැඩසටහන යටතේ රාජකාරි කටයුතු වලට දායක වන සියළුම මට්ටම්වල නිළධාරීන් හා සේවකයන් දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙසද, එසේ සිදු කර මාවෙත වාර්තා කරන ලෙසද කාරුණිකව දන්වමි.

ආර්.පී.ආර්.රාජපක්ෂ,

ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත්:-

01.ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.

02.ඉඩම් කොමසාරිස් (පාලන) - ප්‍රධාන කාර්යාලයේ සියළුම නිළධාරීන්/සේවකයන් දැනුවත් කිරීමට

03.ඉඩම් කොමසාරිස් (ඉඩම්)

04.ඉඩම් කොමසාරිස් (සංවර්ධන) - අ.කා.ස

05.ප්‍රධාන ගණකාධිකාරි

## බිම්සවිය වැඩසටහන යටතේ ලබා දෙන දිරි දීමනා බෙදී යන ආකාරය - 2014

බලපත්‍ර ලබා දීම වෙනුවෙන් (අන්තර් පළාත් බල ප්‍රදේශ)

| | වගකීම් හා කාර්යයන් | වගකීම් දරන පුද්ගලයින් | දිරි දීමනාව (එක් ඉඩම් කැබැල්ලකට) රු. | ස්ථානය |
|---|---|---|---|---|
| 1 | ඉඩම් කච්චේරි යෝජනා නිර්දේශ කිරීම, ඉඩම් කච්චේරි පැවැත්වීම, බලපත්‍ර/ලෙජර් අත්සන් කිරීම. | නි.ඉ.කො. / ස.ඉ.කො. | 70.00 | |
| 2 | ඉඩම් කච්චේරි යෝජනා සකස් කිරීම, පරික්ෂා කිරීම , බලපත්‍ර/ලෙජර් සකස් කිරීම. | සං.ස/ කළ.ස. | 120.00 | ප්‍රාදේශීය කාර්යාලය |
| 3 | ඉඩම් කච්චේරි පැවැත්වීම, ඉඩම් පරික්ෂාව, නිර්දේශ වාර්තා ඉදිරිපත් කිරීම. | ඉ.නි./ජ.නි./ක්ෂේත්‍ර උප. | 180.00 | |
| 4 | ක්ෂේත්‍ර රාජකාරී හා කාර්යාල රාජකාරී සඳහා අවශ්‍ය සහය ලබා දීම | රියදුරු / කා.කා.ස. | 10.00 | |
| 5 | ඉඩම් කච්චේරි යෝජනා පරික්ෂා කර අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම. | කළ.ස. | 60.00 | |
| 6 | ඉඩම් කච්චේරි අනුමත කිරීම, ඉඩම් කච්චේරි පැවැත්වීම, විරෝධතා පරීක්ෂණ පැවැත්වීම, ඉඩම් පරීක්ෂාව. වැඩසටහන් සම්බන්ධීකරණය | ඉ.කො./ නි.ඉ.කො. / ස.ඉ.කො. | 110.00 | |
| 7 | වැඩසටහනට අදාල ප්‍රගති වාර්තා පවත්වාගෙන යාම හා ප්‍රතිපාදන වෙන් කිරීම. | සං.ස/ කළ.ස. | 20.00 | ඉ.කො. ජ. දෙපාර්තමේන්තුව |
| 8 | ගිණුම් පවත්වාගෙන යාම හා ගෙවීම් සිදු කිරීම. | ගිණුම් අංශය | 20.00 | |
| 9 | වැඩසටහන මෙහෙයවීම. | ඉ.කො.ජ. | 40.00 | |
| 10 | ක්ෂේත්‍ර රාජකාරී හා කාර්යාල රාජකාරී සඳහා අවශ්‍ය සහය ලබා දීම. | රියදුරු / කා.කා.ස. | 10.00 | |
| | එකතුව | | **640.00** | |

දීමනාපත්‍ර ලබා දීම වෙනුවෙන්

| | වගකීම් හා කාර්යයන් | වගකීම් දරන පුද්ගලයින් | දිරි දීමනාව (එක් ඉඩම් කැබැල්ලකට) රු. | ස්ථානය |
|---|---|---|---|---|
| 1 | දීමනාපත්‍ර සකස් කිරීම හා අධීක්ෂණය | නි.ඉ.කො. / ස.ඉ.කො. | 50.00 | |
| 2 | 1 ආකෘතිය සම්පූර්ණ කිරීම, දීමනා පත්‍රයට අදාල තොරතුරු පරිගණක ගත කිරීම. | කළ.ස. | 80.00 | ප්‍රාදේශීය කාර්යාලය |
| 3 | 1 ආකෘතිය සම්පූර්ණ කිරීම, ක්ෂේත්‍රය පරික්ෂා කිරීම, නිර්දේශ ඉදිරිපත් කිරීම. | ඉ.නි./ජ.නි./ක්ෂේත්‍ර උප. /ග්‍රා.නි. | 130.00 | |
| 4 | ක්ෂේත්‍ර රාජකාරී හා කාර්යාල රාජකාරී සඳහා අවශ්‍ය සහය ලබා දීම. | රියදුරු / කා.කා.ස. | 10.00 | |
| 5 | අදාල වාර්තා පරික්ෂා කිරීම, දීමනාපත්‍රය මුද්‍රණය කිරීම . නිවැරදි බව පරික්ෂා කිරීම. | පළාත්.ඉ.කො./ නි.ඉ.කො. / ස.ඉ.කො. | 60.00 | |
| 6 | ජනාධිපති ලේකම් වෙත යැවීමට නිර්දේශ ලබා දීම සහ වැඩසටහන සම්බන්ධීකරණය | ඉ.කො./ නි.ඉ.කො. / ස.ඉ.කො. | 90.00 | ඉ.කො. ජ. දෙපාර්තමේන්තුව |
| 7 | දීමනාපත්‍රය ජනාධිපති ලේකම් වෙත යැවීම, වැඩසටහන මෙහෙය වීම. | ඉ.කො.ජ. | 30.00 | |
| 8 | ක්ෂේත්‍ර රාජකාරී හා කාර්යාල රාජකාරී සඳහා අවශ්‍ය සහය ලබා දීම. | රියදුරු / කා.කා.ස. | 10.00 | |
| | එකතුව | | **460.00** | |

මුළු එකතුව **1,100.00**

<u>බිම්සවිය වැඩසටහන යටතේ 2014 වසර සඳහා යෝජිත දිරි දීමනා බෙදී යන ආකාරය</u>

බලපත්‍ර ලබා දීම වෙනුවෙන් (පළාත් සහා බල ප්‍රදේශ)

| | වගකීම් හා කාර්යයන් | වගකීම් දරන පුද්ගලයින් | දිරි දීමනාව (එක් ඉඩම් කැබැල්ලකට) රු. | ස්ථානය |
|---|---|---|---|---|
| 1 | ඉඩම් කච්චේරි යෝජනා නිර්දේශ කිරීම, ඉඩම් කච්චේරි පැවැත්වීම, බලපත්‍ර/ලෙජර් අත්සන් කිරීම. | ප්‍රා.ලේ. / ස. ප්‍රා.ලේ. | 70.00 | ප්‍රා.ලේ. කාර්යාලය |
| 2 | ඉඩම් සඳහා ඉල්ලුම් පත්‍ර නිර්දේශ කර ඉදිරිපත් කිරීම, පුද්ගල තොරතුරු ඉදිරිපත් කිරීම. | ග්‍රා.නි. | 30.00 | |
| 3 | ඉඩම් කච්චේරි යෝජනා සකස් කිරීම, පරික්ෂා කිරීම , බලපත්‍ර/ලෙජර් සකස් කිරීම. | සං.ස/ කළ.ස. | 110.00 | ප්‍රා.ලේ. කාර්යාලය / පළාත්.ඉ.කො. දෙපාර්තමේන්තුව |
| 4 | ඉඩම් කච්චේරි පැවැත්වීම, ඉඩම් පරික්ෂාව, නිර්දේශ වාර්තා ඉදිරිපත් කිරීම. | ඉ.නි./ජ.නි./ක්ෂේත්‍ර උප. | 180.00 | |
| 5 | ඉඩම් කච්චේරි අනුමත කිරීම, ඉඩම් කච්චේරි පැවැත්වීම, විරෝධතා පරීක්ෂණ පැවැත්වීම, ඉඩම් පරික්ෂාව. | පළාත්.ඉ.කො./ නි.ඉ.කො. / ස.ඉ.කො. | 70.00 | |
| 6 | ක්ෂේත්‍ර රාජකාරී හා කාර්යාල රාජකාරී සඳහා අවශ්‍ය සහය ලබා දීම | රියදුරු / කා.කා.ස. | 10.00 | |
| 7 | ඉඩම් කච්චේරි අනුමත කිරීම, ඉඩම් කච්චේරි පැවැත්වීම, විරෝධතා පරීක්ෂණ පැවැත්වීම, ඉඩම් පරික්ෂාව. වැඩසටහන් සම්බන්ධීකරණය | ඉ.කො./ නි.ඉ.කො. / ස.ඉ.කො. | 80.00 | ඉ.කො. ජ. දෙපාර්තමේන්තුව |
| [illegible] | වැඩසටහනට අදාල ප්‍රගති වාර්තා පවත්වාගෙන යාම හා ප්‍රතිපාදන වෙන් කිරීම | සං.ස/ කළ.ස. | 20.00 | |
| 9 | ගිණුම් පවත්වාගෙන යාම හා ගෙවීම් සිදු කිරීම | ගිණුම් අංශය | 20.00 | |
| 10 | වැඩසටහන මෙහෙයවීම | ඉ.කො.ජ. | 40.00 | |
| 11 | ක්ෂේත්‍ර රාජකාරී හා කාර්යාල රාජකාරී සඳහා අවශ්‍ය සහය ලබා දීම | රියදුරු / කා.කා.ස. | 10.00 | |
| | එකතුව | | 640.00 | |

දීමනාපත්‍ර ලබා දීම වෙනුවෙන්

| | වගකීම් හා කාර්යයන් | වගකීම් දරන පුද්ගලයින් | දිරි දීමනාව (එක් ඉඩම් කැබැල්ලකට) රු. | ස්ථානය |
|---|---|---|---|---|
| 1 | දීමනාපත්‍ර සකස් කිරීම හා අධීක්ෂණය | ප්‍රා.ලේ. / ස. ප්‍රා.ලේ. | 50.00 | ප්‍රා.ලේ. කාර්යාලය |
| [illegible] | 1 ආකෘතිය සම්පූර්ණ කිරීම, දීමනා පත්‍රයට අදාල තොරතුරු පරිගණකගත කිරීම. | කළ.ස. | 80.00 | ප්‍රා.ලේ. කාර්යාලය / පළාත්.ඉ.කො. දෙපාර්තමේන්තුව |
| 3 | 1 ආකෘතිය සම්පූර්ණ කිරීම, ක්ෂේත්‍රය පරික්ෂා කිරීම, නිර්දේශ ඉදිරිපත් කිරීම. | ඉ.නි./ජ.නි./ක්ෂේත්‍ර උප. /ග්‍රා.නි. | 110.00 | |
| 4 | අදාල වාර්තා පරික්ෂා කර නිර්දේශ ඉදිරිපත් කිරීම. | පළාත්.ඉ.කො./ නි.ඉ.කො. / ස.ඉ.කො. | 50.00 | |
| 5 | ක්ෂේත්‍ර රාජකාරී හා කාර්යාල රාජකාරී සඳහා අවශ්‍ය සහය ලබා දීම | රියදුරු / කා.කා.ස. | 10.00 | |
| 6 | දීමනාපත්‍රය මුද්‍රණය කිරීම , නිවැරදි බව පරික්ෂා කිරීම | කළ.ස. | 40.00 | ඉ.කො. ජ. දෙපාර්තමේන්තුව |
| 7 | ජනාධිපති ලේකම් වෙත යැවීමට නිර්දේශ ලබා දීම සහ වැඩසටහන සම්බන්ධීකරණය | ඉ.කො./ නි.ඉ.කො. / ස.ඉ.කො. | 80.00 | |
| 8 | දීමනාපත්‍රය ජනාධිපති ලේකම් වෙත යැවීම, වැඩසටහන මෙහෙය වීම | ඉ.කො.ජ. | 30.00 | |
| 9 | ක්ෂේත්‍ර රාජකාරී හා කාර්යාල රාජකාරී සඳහා අවශ්‍ය සහය ලබා දීම | රියදුරු / කා.කා.ස. | 10.00 | |
| | එකතුව | | 460.00 | |

මුළු එකතුව 1,100.00

**බිම්සවිය වැඩසටහන යටතේ ලබා දෙන දිරි දීමනා බෙදී යන ආකාරය - 2014**

දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබා දීම වෙනුවෙන් (අන්තර් පළාත්/ පළාත් සහා ප්‍රදේශ)

| | වගකීම් හා කාර්යයන් | වගකීම් දරන පුද්ගලයින් | දිරි දීමනාව (එක් ඉඩම් කැබැල්ලකට) රු. | ස්ථානය |
|---|---|---|---|---|
| 1 | නිර්දේශ ඉදිරිපත් කිරීම | ප්‍රා.ලේ/ස.ප්‍රා.ලේ | 30.00 | ප්‍රා.ලේ කාර්යාලය |
| 2 | නිර්දේශ වාර්තා සකස් කිරීම | ඉ.නි/ජ.නි/කළ.ස | 60.00 | ප්‍රා.ලේ කාර්යාලය/ පළාත්.ඉ.කො කාර්යාලය |
| 3 | අදාළ වාර්තා පරීක්ෂා කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම | පළාත්.ඉ.කො/නි.ඉ.කො /ස.ඉ.කො | 40.00 | |
| 4 | වාර්තා පරීක්ෂා කිරීම | සං.ස /කළ.ස | 80.00 | ඉ.කො.ජ. දෙපාර්තමේන්තුව |
| 5 | නිර්දේශ ඉදිරිපත් කිරීම | ඉ.කො/නි.ඉ.කො/ ස.ඉ.කො | 60.00 | |
| 6 | එකඟතාවය ලබා දීම | ඉ.කො.ජ | 20.00 | |
| [illegible] | වාර්තා පරීක්ෂා කිරීම | සං.ස/කළ.ස | 50.00 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය |
| 8 | පරීක්ෂා කර නිර්දේශ සකස් කිරීම | ස.ලේ/ජ්‍යේ.ස.ලේ | 40.00 | |
| 9 | ගරු ඇමතිතුමා වෙත නිර්දේශ ලබා දීම හා වැඩසටහන මෙහෙයවීම | ලේකම්/ අති.ලේකම් | 80.00 | |
| | එකතුව | | 460.00 | |